මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.:

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2016.08.03

**රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක :- 250/2016 (i)**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ

දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

<u>බාහිර පාර්ශ්වයන් සඳහා අත්තිකාරම් මුදල් ගෙවීම ගිණුම්ගත කිරීම</u>

මුදල් රෙගුලාසි 365(1) අනුව මුදල් වර්ෂයක් තුළ අනුමත ගෙවීම් සඳහා රාජ්‍ය ආයතන හා රජයේ නිලධාරීන් වෙත අතුරු අග්‍රිම ලබාදීම වෙනුවෙන් ප්‍රතිපාදන සලසා ඇත. එසේ වුවද, රාජ්‍ය නිලධාරීන් නොවන පුද්ගලයන් හා ආයතන වෙත අතුරු අග්‍රිම ලබාදීමට එමගින් ප්‍රතිපාදන සලසා නොමැත.

වර්තමානයේදී රජයේ කාර්යාල ගොඩනැගිලි කුලී පදනම මත ලබාගැනීමේදී හා වැඩ කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් මුදල් ගෙවීමේදී ඒ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ගිණුම් තැබීමේ ක්‍රියාපිළිවෙත පිළිබඳව පැහැදිලි මඟ පෙන්වීමක් නොමැති හෙයින් බාහිර පාර්ශ්වයන් වෙත ලබාදෙන අත්තිකාරම් ගිණුම් තැබීමේදී පහත සඳහන් පිළිවෙත අනුගමනය කළ යුතු බව අවධාරණය කෙරේ.

(1) කාර්යාල ගොඩනැගිලි කුලී සඳහා අත්තිකාරම් ගෙවීමේදී එම සම්පූර්ණ අත්තිකාරම් මුදලම වැය විෂය අංක 1404 එනම් බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු වැය විෂයට හර කර ගෙවිය යුතු ය.

වැඩ කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් ගෙවීමේදී වැය විෂය අංක 2104 යටතේ සිදුකරනු ලබන වැඩ අත්තිකාරම් සඳහා පමණක් යෝජිත ක්‍රමවේදය අනුව ගිණුම් තැබීම සිදුකළ යුතු අතර වෙනත් ප්‍රාග්ධන වැය විෂයන් යටතේ සිදුකරන වැඩ අත්තිකාරම් සඳහා මෙම ගිණුම් ක්‍රමවේදය අදාළ නොවේ.

(2) අත්තිකාරම් ගෙවීම, වියදම් දරන වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත වීම හේතුවෙන් ගිණුම් කාල පරිච්ඡේදයෙන් ඔබ්බට ගෙවන ලද අත්තිකාරම් මුදල ජනරජ ගිණුමේ රජයට ඇති හිමිකමක් ලෙස නිරූපණය නොවේ. එබැවින් අත්තිකාරම් මුදල් ගෙවීම ජනරජ ගිණුමේ හෙළිදරව් කිරීම අරමුණු කරගෙන ප්‍රධාන ලෙජර් ගිණුම් අංක 9188 - කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම හා 9189 - කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම හඳුන්වාදෙනු ලැබේ.

(3) අත්තිකාරම් මුදල් ගෙවීමට අපේක්ෂා කරන අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ගෙවනු ලබන එක් එක් අත්තිකාරම් වෙනුවෙන් ඉහත සඳහන් ප්‍රධාන ලෙජර් ගිණුම් යටතේ වෙනම ගිණුම් අංකයක් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතු අතර අත්තිකාරම් මුදල් ගෙවීමේදී වැය විෂය හා මුදල් පොතට සිදුකරන සටහන්වලට අමතරව පහත සඳහන් ජර්නල් සටහන ද ගිණුම්ගත කළ යුතු ය.

9188 - කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම හර

9189 - කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම බැර

(ගෙවන ලද මුළු කුලී අත්තිකාරම් හෝ වැඩ අත්තිකාරම් මුදල)

(4) සෑම වර්ෂයක් අවසානයේදීම එම වර්ෂයට අදාළ කුලී වටිනාකම හෝ කොන්ත්‍රාත්තුවලට අදාළව ඉටුකළ වැඩ අනුව අයකරගනු ලබන අත්තිකාරම් මුදල පහත පරිදි ගිණුම්ගත කළ යුතු ය.

9189 - කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම හර

9188 - කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම බැර

(එක් එක් වර්ෂයට අදාළව හිලව් කරනු ලබන කුලී වටිනාකම හෝ කොන්ත්‍රාත්තුවල කොටස් ගෙවීමේදී අයකරගනු ලබන වැඩ අත්තිකාරම් වටිනාකම අත්තිකාරම් ගිණුමෙන් ඉවත් කිරීම)

(5) ඉහත සඳහන් ප්‍රධාන ලෙජර් ගිණුම්වල වර්ෂ අවසාන ශේෂය මගින් තවදුරටත් අයවිය යුතු අත්තිකාරම් මුදල නියෝජනය වන අතර අත්තිකාරම් සම්බන්ධයෙන් රජය සතු හිමිකමද ජනරජ ගිණුමෙන් පෙන්නුම් කෙරේ.

(6) ඉහතින් දක්වන ලද ගිණුම් සටහන් සිගාස් වැඩසටහන යටතේ ගිණුම්ගත කිරීමට හැකිවන පරිදි එම වැඩසටහන යාවත්කාලීන කර ඇති අතර මෙම චක්‍රලේඛයේ උපදෙස් පරිදි මින් ඉදිරියට අත්තිකාරම් ගෙවීම් ගිණුම්ගත කළ යුතු බව අවධාරණය කෙරේ.

ඒ අනුව මීට අදාළ 2016.06.09 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 250/2016 මෙයින් අවලංගු වේ.

එස්.ආර්. ආටිගල

භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්

පිටපත:

විගණකාධිපති